අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.: ED/05/67/37/04 (වා.ස්.මා.2024)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.:
දිනය / திகதி / Date: 2024.05. 06

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්
සියළුම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්/ජාතික පාසල් විදුහල්පතිවරුන්/
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්, ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

**<u>අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2024</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කළ මගේ අංක ED/05/67/37/04 (වා.ස්.මා.2024) හා 2023.11.27 සහ එම මාරු නියෝග සම්බන්ධයෙන් කරන ලද අභියාචනා සඳහා ලබා දුන් තීරණ හා බැඳේ.

02. වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ එක් එක් නිලධාරියා හට වෙන් වෙන් වශයෙන් ස්ථාන මාරුවීම් ලිපි මෙම අමාත්‍යාංශය මගින් නිකුත් කරනු <u>නොලැබේ.</u>

03. අධ්‍යාපන චක්‍රලේඛ අංක 26/2023 හි 08 III වගන්තියට අනුව, අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ස්ථාන මාරු ලද කාර්යය මණ්ඩලය මුදා හැරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු ය.

04. නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ආයතන ප්‍රධානීන් එම නිලධාරීන් මුදා හැරීමට කටයුතු නොකරන අවස්ථාවේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 වගන්තියට අනුව ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූල ව කටයුතු කිරීමට සිදුවන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. එම නියෝග අනුව නව සේවා ස්ථානවල සේවයට වාර්තා නොකළ සියලුම නිලධාරීන්ගේ නම් පැරණි සේවා ස්ථානවල වැටුප් ලේඛනවලින් ඉවත් කිරීමටත්, 2024 මැයි මස සිට ඔවුන්ට වැටුප් ගෙවීම නතර කිරීමටත් වහාම පියවර ගන්නා ලෙස මෙයින් දැනුම් දෙමි.

06. එක් එක් කලාපයන්ට අදාළ 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබී ඇති කාර්යය මණ්ඩල තොරතුරු මේ සමඟ අමුණා එවන අතර එම ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රගතිය 2024.05.17 දිනට මා වෙත වාර්තා කරන ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන්, ඔබ දක්වන කඩිනම් ප්‍රතිචාරය බෙහෙවින් අගය කරමි.

Jayasundara

ජේ.එම්.තිලකා ජයසුන්දර
අධ්‍යාපන ලේකම්

පිටපත් -

01.විගණකාධිපති - නව සේවා ස්ථානවල රාජකාරි සඳහා වාර්තා නොකරන ලද නිලධාරීන්ගේ වැටුප් අත්හිටුවා ඇත්දැයි පරීක්ෂා කිරීම.

02.ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැ.ගැ.ස